කොවිඩ්-19 තුන්වන රැල්ල ශ්‍රී ලංකාවේ පැතිර ඇති මේ මොහොතේ ඇතැම් රූපවාහිනී වැඩසටහන් තුළ නිවේදකයන් සහ ආරාධිත තරු ඇතුළු වැඩසටහනට පෙනී සිටින්නන් මුඛ ආවරණ පැළඳීමකින් තොරව, මුහුණු ආවරණ පමණක් පැළඳ සිටීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාල තුළ කතිකාවක් පසුගිය දිනවල ඇතිවී තිබෙනු දක්නට ලැබිණි.
කොවිඩ්-19 තත්වය ඇති කරවන සාර්ස්-කොව්-2 වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා මුහුණු ආවරණ (face shields)පමණක් භාවිතය ප්‍රමාණවත් නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානයත්, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයත් පවසයි. ඔවුන් පවසන්නේ මුහුණු ආවරණ යනු මුඛ ආවරණ පැළඳ සිටින විට අමතර ආරක්ෂාවක් පමණක් බවයි.
මෙහිදී මුඛ ආවරණ දමා වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී තාක්ෂණික ගැටළු මතුවිය හැකි බව අපට වටහා ගත හැක. මුහුණු ආවරණ පමණක් හෝ යොදාගැනීම සද් අරමුණින් සිදුවන්නක් විය හැක. එනමුත්, එසේ මුහුණු ආවරණ පමණක් පැළඳ වැඩසටහන් ඉදිරිපත් කිරීම ඔස්සේ, කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා මුහුණු ආවරණ පමණක් පැළඳීම වුවත් ප්‍රමාණවත් බවට සමාජයට අදහසක් ඉදිරිපත් නොවන්නේද? ජනතාව තමන් ප්‍රිය කරන නළු නිළියන්, ගායක ගායිකාවන් වැනි තරු අනුගමනය කිරීමේ නැඹුරුතාවක්ද තිබෙන බව සැලකිල්ලට ගත් විට, මෙය සමාජයට අයහපත් පූර්වාදර්ශයක් විය හැකිද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
අප මෙහිදී උදාහරණ ලෙසින් ඉදිරිපත් කර ඇති වැඩසටහන් හැරෙන්නට තවත් මේ ආකාරයේ වැඩසටහන් ඔබට දකින්නට ලැබුණි නම්, මෙම පෝස්ටුවට කමෙන්ට් ලෙසින් ඒවා සම්බන්ධයෙන්ද සඳහන් කළ හැක.
මූලාශ්‍ර:
**https://www.facebook.com/626500691035511/posts/1469255806759991/**
https://www.who.int/.../advice-on-the-use-of-masks-in-the...
#MediaEthicsSL #lka #SinhalaNews #Swarnavahini #ITN #Sirasa #SiyathaTV